ඉතාලිය

# රැකවරණය සඳහා අයදුම් කිරීම පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ

## භාරකරුවෙකු නොමැති දරුවන් සඳහා තොරතුරු




ආයුබෝවන්, අපි විවිධ රටවල දරුවෝ. ආරක්ෂාව බලාපොරොත්තුවෙන් ඉතාලිය වෙත පැමිණීමට පෙර අපි බොහෝ දුර ගමන් කළා. අපි පැමිණියේ අපේ දෙමව්පියන් නැතිව තනිවම.
ආයුබෝවන්. මගේ නම ලීසා. රැකවරණය සඳහා අයදුම් කිරීම (ජාත්‍යන්තර ආරක්ෂාව ලෙස ද හැඳින්වේ) පිළිබඳව ඔබ දැනගත යුතු දේවල් මම ඔබට පැහැදිලි කරන්නම්.

# ජාත්‍යන්තර ආරක්ෂාව යනු කුමක්ද?







යම් පුද්ගලයෙකුට ඔවුන් එහි අනතුරක සිටින නිසා තම මව් රටට ආපසු යාමට නොහැකි නම්, ඔවුන්ට ජාත්‍යන්තර ආරක්ෂාව ලබා ගත හැකියි, එමෙන්ම මෙම ආරක්ෂාව ලබා දුන් රට තුළ ආරක්ෂිතව නැවතී සිටිය හැකියි.

ජාත්‍යන්තර ආරක්ෂාව ලබා ගත හැක්කේ කාට ද සහ ක්‍රියාපටිපාටිය කුමක්ද යන්න ඔබේ භාරකරු ඔබට තවදුරටත් පැහැදිලි කරාවි.

යුරෝපයේ, ජාත්‍යන්තර ආරක්ෂාව රැකවරණය, සරණාගත තත්ත්වය හෝ අනුබද්ධ ආරක්ෂාව ලෙස ද හැඳින්විය හැකියි. ඇතැම් විට ඔබ දැනටමත් රැකවරණය යන වචනය අසා ඇති. ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳව කතා කරන විට මම රැකවරණය යන වචනය භාවිත කරන්නම්, ඒ එය ඔබට මතක තබා ගැනීමට පහසු නිසා.

## මතක තබාගන්න, ඔබ දැන් සුරක්ෂිතයි.


යුරෝපයේ සෑම කෙනෙකුටම ඔවුන් කොහේ සිට පැමිණියත්, ඔවුන්ගේ ආගම හෝ ඔවුන්ගේ සමේ වර්ණය නොසලකා එක හා සමානව සලකනු ලැබේ.





යුරෝපයේ, අවුරුදු 18 ට අඩු සෑම කෙනෙකුම දරුවෙකු ලෙස සලකනවා.

දරුවෙකු ලෙස ඔබට විශේෂ අයිතිවාසිකම් තිබෙනවා. ඔබේ ආරක්ෂාව සහ යහපැවැත්ම ඉතාමත් වැදගත්.



මෙහි පෙන්වා ඇති පරිදි, ඔබට රැකවරණ අධිකාරියේ කාර්ය මණ්ඩලය වැනි විවිධ නිලධාරීන් හමු වේවි. ඔවුන් ඔබ පිළිබඳව සහ ඔබේ යුරෝපයට යන ගමන පිළිබඳව ප්‍රශ්න අසාවි.

මතක තබා ගන්න, නිලධාරීන් මෙහි සිටින්නේ ඔබව ආරක්ෂා කිරීමට සහ ඔබට වඩාත් සුදුසු දේ තීරණය කිරීමටයි.

ඔබ සිතන දේ, ඔබට අවශ්‍ය දේ සහ ඔබට හැඟෙන ආකාරය ඔබට සැමවිටම නිලධාරීන් සමඟ බෙදා ගත හැකියි.



# භාරකරුවෙකු යනු කවුද?





ඔබ ඔබේ දෙමාපියන් නැතිව මෙහි පැමිණි නිසා, බලධාරීන් ඔබට සහාය වන භාරකරුවෙකු ලෙස හඳුන්වන වැඩිහිටියෙකු ඔබට ලබා දේවි.

භාරකරුවෙකු යනු තම දෙමාපියන් හෝ ඔවුන් වෙනුවෙන් වගකිව යුතු වෙනත් වැඩිහිටියෙකු නොමැතිව යුරෝපයට පැමිණෙන දරුවන්ට සහාය වන පුද්ගලයෙක්.

භාරකරුවෙකු පිරිමියෙකු හෝ කාන්තාවක විය හැකියි. භාරකරුවන් නියෝජිතයන් ලෙස ද හැඳින්විය හැකියි.

ඔබ තවමත් ඔබේ භාරකරු හමුවී නොමැති නම්, හැකි ඉක්මනින් ඔබ ඔවුන් හමුවේවි.

ඇතැම් විට, ඔබ ඔබේ ස්ථීර භාරකරු හමුවන තෙක් ඔබට සහාය වීමට බලධාරීන් පළමුව තාවකාලික භාරකරුවෙකු පත් කළ හැකියි.





භාරකරුවෙකු සිටින්නේ ඔබේ නැවතී සිටීම පිළිබඳව ඔබට දැනගත යුතු සියල්ල පැහැදිලි කිරීමට සහ වැදගත් තීරණ ගැනීමට ඔබට උපකාර කිරීමටයි. උදාහරණයක් ලෙස, භාරකරුවෙකු ඔබේ රැකවරණ අයදුම්පත සම්බන්ධයෙන් ඔබට සහාය වේවි, ක්‍රියාපටිපාටි පැහැදිලි කරාවි, ඔබේ අයිතිවාසිකම් සහ වගකීම් පැහැදිලි කරාවි සහ බලධාරීන් සමඟ ඇති රැස්වීම්වලට ඔබ සමඟ සහභාගී වේවි.

ඔබට සැමවිටම භාරකරුට ඔබේ අදහස පැවසිය හැකියි, ඔවුන්ගෙන් ප්‍රශ්න ඇසිය හැකියි සහ ඔබට යමක් අවශ්‍ය නම් ඔවුන්ට පැවසිය හැකියි. ඔවුන් සිටින්නේ  ඔබට සහාය වීමටයි.



ඔබේ භාරකරු පිළිබඳව ඔබට ගැටලුවක් තිබේ නම්, නිලධාරීන්ට  පවසන්න. එය ඔබේ රැකවරණ අයදුම්පතට අහිතකර ලෙස බලපාන්නේ නැත.





# ක්‍රියාපටිපාටිය අතරතුර ඔබට ලබා දෙන උපකාර මොනවාද?



නැවතී සිටීමට ආරක්ෂිත ස්ථානයක්



ඇඳුම්



ඔබට අවශ්‍ය විය හැකි වෙනත් දේවල්



ආහාර



ඔබට වෛද්‍යවරයා වෙත යා හැකිය



ඔබ පාසැල් යනු ඇත



ඔබට සුදුසු ස්ථානයක ඔබ ජීවත් වන අතර ඔබේ වයස අනුව ඔබට අවශ්‍ය උපකාර ලැබේවි

# මම රැකවරණය ඉල්ලුම් කළා, දැන් සිදුවන්නේ කුමක්ද?






**පළමුව, ඔබේ අයදුම්පත ලියාපදිංචි කර ඉදිරිපත් කළ යුතුය.**

2026 ඔක්තෙෝබර් 31 දක්වා ඔබේ අයදුම්පත දින පහක් ඇතුළත ලියාපදිංචි කර විධිමත් කරනු ලැබේ.නු ඇත.

ඔබේ භාරකරු / ඔබේ තාවකාලික භාරකරු / ඔබ ජීවත් වන ස්ථානයේ සේවය කරන වැඩිහිටියන් දිනය / දින සහ වේලාව / වේලාවන් පිළිබඳව ඔබට දැනුම් දෙන අතර ඔබේ භාරකරු ඔබ සමඟ බලධාරීන් වෙත පැමිණෙනු ඇත.

ක්‍රියාපටිපාටිය අතරතුර ඔබේ භාරකරු ඔබ සමඟ සිටීවි.



# ලියාපදිංචි කිරීම ඉදිරිපත් කිරීම අතරතුර පහත සඳහන් දේ සිදු වේවි...





ඔබ සතුව ඇති සියලුම හැඳුනුම් ලේඛන (විදේශ ගමන් බලපත්‍රය, හැඳුනුම්පත ආදිය) නිලධාරීන්ට පෙන්වනු ඇත.

ඔබ සහ ඔබේ බඩු භාණ්ඩ සෝදිසි කළ හැකිය. බලධාරීන් ඔබේ බඩු බාහිරාදිය ටික කලකට තබා ගත හැකි නමුත් භයානක යැයි සැලකෙන ඕනෑම බඩු භාණ්ඩයක් හැර අනෙක් සියලු දේම ඔබට ආපසු ලබා දෙනු ඇත.





ඔබව ඡායාරූප ගත කරනු ඇත.

ඔබේ ඇඟිලි සලකුණු ලබා ගනු ඇත.







ඔබට වෛද්‍යවරයෙකු හමුවිය හැකිය.

- නිලධාරියෙකු ඔබ පිළිබඳව සහ යුරෙ◌ෝපයේ සිටින ඔබේ පවුල පිළිබඳව ප්‍රශ්න අසනු ඇත
- අමතර තොරතුරු රැස් කරනු ඇත: ඔබ කතා කරන භාෂා මෙන්.

නිලධාරියෙකු ඔබේ සම්බන්ධතා තොරතුරු (ලිපිනය සහ දුරකථන අංකය) ලබා දෙන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ඇත.

පහත ඒවා පිළිබඳව ඔබෙන් අමතර ප්‍රශ්න අසනු ඇත:

- ඔබ සහ ඔබේ පවුලේ අය
- ඔබේ රට සහ ඔබ කලින් ජීවත් වූ ස්ථාන
- ඔබ ඔබේ රට හැර යාමට හේතු සහ ඔබ ආපසු යාමට අවශ්‍ය නොවීමට හේතු
- ඉතාලිය වෙත ඔබ ගමන් කළ ආකාරය.





## මතක තබා ගන්න!

ඔබේ භාරකරු සමඟ ඔබ කතා කිරීම සහ රැකවරණ බලධාරීන් සමඟ එක්ව කටයුතු කිරීම ඉතාමත් වැදගත්.

ඔබ ඔබේ භාරකරුට හෝ නිලධාරීන්ට පවසන දේ රහසිගතව පවතිනු ඇත. මෙයින් අදහස් වන්නේ ඔබ ඔවුන්ට ලබා දෙන තොරතුරු කිසි විටෙකත් ඔබේ මව් රටේ රජය සමඟ හෝ ඔබ බිය වන පුද්ගලයින් සමඟ බෙදා නොගන්නා බවයි.




රැකවරණ ක්‍රියාපටිපාටිය අතරතුර මම ඉතාලිය හි නැවතී සිටිනවාද?





ලියාපදිංචියෙන් පසුව, බලධාරීන් ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන රට ද යන්න තීරණය කරනු ඇත. එය ඉතාලිය හෝ වෙනත් යුරෝපීය රටක් වනු ඇත. ඔබට රට තෝරා ගත නොහැකියි, නමුත් ඔබේ යහපත සැලකිල්ලට ගනු ගනු ඇත. බලධාරීන් මෙය ඔබට පැහැදිලි කරාවි.





ලියාපදිංචි කිරීමේ දී පහත කරුණු බලධාරීන්ට පැවසීම වැදගත් වේ:

- ඔබට වෙනත් යුරෝපීය රටක පවුලක් සිටී නම්
- ඔබ මීට පෙර වෙනත් යුරෝපීය රටක රැකවරණය සඳහා ඉල්ලුම් කර තිබේ නම්.

ඔබට යුරෝපයේ පවුලක් සිටී නම්, ඔබේ පවුල පිළිබඳව ඔබ දන්නා සියල්ල නිලධාරීන්ට පැවසීම වැදගත් වේ. ඔබට ඔවුන් සමඟ මේ රටේ හෝ ඔවුන් ජීවත් වන රටේ නැවතී සිටීමට හැකියාව තිබේ.

ඔබේ පවුලේ අය සිටින්නේ කොහේදැයි ඔබ නොදන්නේ නම්, හෝ ඔවුන් සමඟ සම්බන්ධතා නැති වී ඇත්නම්, ඔබේ පවුල සොයා ගැනීමට ඔබේ භාරකරුගෙන් / නිලධාරීන්ගෙන් උපකාර ඉල්ලා සිටිය හැකියි.



# ලියාපදිංචි කිරීමෙන් සහ ඉදිරිපත් කිරීමෙන් පසුව කුමක් සිදුවේද?





ලියාපදිංචි කිරීමෙන් පසුව, ඔබේ අයදුම්පත සකස් කර ලියාපදිංචි කළ බවට (තාවකාලික) ලේඛනයක් ඔබට ලැබෙනු ඇත.

ඔබ ඔබේ අයදුම්පත ලියාපදිංචි කළ සහ ඉදිරිපත් කළ පසුව, ඔබ රැකවරණය ඉල්ලා ඇති බවට ලේඛනයක් ඔබට ලබා දෙනු ඇත. මෙම ලේඛනය වැදගත් නිසා එය හොඳින් රැකබලා ගන්න. ඔබ නැවතී සිටින ස්ථානයෙන් පිටවන සෑම අවස්ථාවක ම හෝ ඔබට බලධාරීන් සමඟ හමුවීමක්  තිබෙන විට එය ඔබ සමඟ රැගෙන යන්න.



# නිලධාරීන් මගේ වයස දැනගන්නේ කෙසේද?





ඔබේ වයස සනාථ කිරීමට ලියකියවිලි නොමැති නම් සහ බලධාරීන්ට ඔබේ වයස පිළිබඳව සැකයක් ඇත්නම්, රැකවරණ බලධාරීන්ගේ කාර්ය මණ්ඩලයට වයස් තක්සේරුවකට මුහුණ දීමට ඔබෙන් ඉල්ලා සිටිය හැකියි. මෙය ඔබේ වයස ඇස්තමේන්තු කිරීමට උපකාරී වන අභ්‍යාසයකි.

ඔබේ වයස තක්සේරු කිරීමට විවිධ ක්‍රම තිබේ.

උදාහරණයක් ලෙස, එය ඔබ ඉදිරිපත් කර ඇති ලියකියවිලි හෝ නිලධාරීන් හෝ විවිධ විශේෂඥයින් සමඟ සම්මුඛ පරීක්ෂණ මත පදනම් විය හැකියි. තවත් සැකයන් තිබේ නම්, ඔබෙන් වෛද්‍ය පරීක්ෂණයක් සිදු කරන ලෙස ඉල්ලා සිටිය හැකියි. මෙම අවස්ථාවේ දී, ඔබෙන් සහ ඔබේ භාරකරුගෙන් කැමැත්ත ලබා දෙන ලෙස ඉල්ලා සිටිනු ඇත.

වයස් තක්සේරුව මඟින් ඔබ අවුරුදු 18 ට වැඩි බව නිගමනය කළහොත්, ඔබ වැඩිහිටියෙකු ලෙස සලකනු ලැබේ. මෙම අවස්ථාවේ දී, ඔබට වැඩිදුර තොරතුරු ලැබෙනු ඇත.





යමෙකු ඔබට රිදවා ඇති බවට බලධාරීන්ට හැඟීමක් ඇත්නම්, ඔවුන් ඔබට වෛද්‍යවරයෙකු හමුවීමට යෝජනා කරනු ඇත.

ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීමේ දී වෛද්‍ය පරීක්ෂණයේ ප්‍රතිඵල සැලකිල්ලට ගනු ඇත.




**ඔබේ අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසුව, ඔබට පුද්ගලික සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් තිබිය හැකියි.**

මෙයින් අදහස් වන්නේ නිලධාරියෙකු ඔබ පිළිබඳව, ඔබ ඔබේ රට හැර යාමට හේතුව සහ ඔබ ආපසු යාමට අකමැති හේතුව පිළිබඳව තවත් ප්‍රශ්න අසනු ඇති බවයි. බලධාරීන් ඔබෙන් සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වන ලෙස ඉල්ලා සිටියහොත්, ඔබ එයට සහභාගී වී ඔබට මතක ඇති සියල්ල ඔවුන්ට පැවසිය යුතුය. පුද්ගලික සම්මුඛ පරීක්ෂණය ශ්‍රව්‍ය පටිගත කරනු ඇත.

සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන්නේ කවදාද සහ කොතැනද යන්න ඔබේ භාරකරු ඔබට පවසන අතර සම්මුඛ පරීක්ෂණය අතරතුර ඔබට සහාය වනු ඇත.



# මට නිලධාරීන්ගේ භාෂාව වැටහෙන්නේ නැතිනම්?





ඔබට නිලධාරීන්ගේ ඉතාලි භාෂාව වැටහෙන්නේ නැතිනම්, ඔබේ භාෂාව කතා කළ හැකි පරිවර්තකයෙකු ඔබට වටහා ගැනීමට උපකාර කරනු ඇත

ඔබේ විමර්ශනයේ දී පවසන දේ පරිවර්තනය කිරීම හැර වෙනත් කිසිදු කාර්යභාරයක් පරිවර්තකයෙකුට නොමැත. ඔබ විමර්ශන නිලධාරියාට සහ පරිවර්තකයාට පවසන දේ රහසිගතව පවතිනු ඇත.

ඔබට වඩාත් පහසු යැයි හැඟෙන දේ අනුව, ඔබේ සම්මුඛ පරීක්ෂකවරයා හෙ◌ෝ පරිවර්තකයා කාන්තාවක හෙ◌ෝ පිරිමියෙකු වන ලෙස ඉල්ලා සිටිය හැකියි. ලබා ගත හැකි නම් ඔවුන් ලබා දෙනු ඇත. ඔබ වඩාත් කැමති කාන්තාවකට ද පිරිමියෙකු ට යන්න හැකි ඉක්මනින් සහ සම්මුඛ පරීක්ෂණයට පෙර ඔබේ භාරකරුට දන්වන්න.






**ඒ සියල්ලට ම කොපමණ කාලයක් ගතවේද?**



සම්මුඛ පරීක්ෂණයෙන් පසුව, ඔබ පැහැදිලි කළ සියල්ල ම පරීක්ෂා කරනු ඇත.

ඉදිරිපත් කළ දින සිට, ඔබේ තීරණය ලැබීමට ඔබට **මාස 6ක්** දක්වා පොරොත්තුව සිටීමට සිදු විය හැකියි. ඇතැම් විට, එය දිගු විය හැකි නමුත්, **මාස 21කට** වඩා වැඩි කාලයක් ගත නොවිය යුතුය. බලා සිටීම දුෂ්කර විය හැකි නමුත් ඉවසිලිවන්ත වන්න. බලධාරීන්ට ඔබ වෙනුවෙන් නිවැරදි තීරණයක් ගැනීමට අවශ්‍ය වේ.

පොරොත්තුව සිටීම සමඟ සාර්ථකව කටයුතු කිරීමට ඔබට සැමවිටම ඔබට උපකාර අවශ්‍ය නම් ඔබේ භාරකරුගෙන් ඉල්ලා සිටිය හැකියි.



**ඔහුගේ රැකවරණ අයදුම්පත බලධාරීන් සමාලෝචනය නොකරන බව මිතුරෙක් පැවසුවා. ඒ කුමක් නිසා ද?**





බලධාරීන් පළමුව රැකවරණ අයදුම්පතක් පරීක්ෂා කිරීමට අවශ්‍ය ද නැද්ද යන්න පරීක්ෂා කරයි.

ඔබට දැනටමත් වෙනත් රටක ආරක්ෂාව ලබා දී ඇත්නම් හෝ ඔබ පැමිණියේ ආරක්ෂිත යැයි ඔවුන් සලකන රටකින් නම් බලධාරීන් ඔබේ අයදුම්පත සම්පූර්ණයෙන් පරීක්ෂා නොකරනු ඇත.

# මට ලැබෙන්නේ කුමන තීරණයක් ද?





ඔබට රැකවරණය අවශ්‍යද නැතහොත් ඔබට වෙනත් විකල්ප තිබේ ද යන්න රැකවරණ බලධාරීන් විසින් තීරණය කරනු ඇත.

තීරණය ඔබට පැහැදිලි කරනු ඇත.



ඔබට ප්‍රතික්ෂේපිත තීරණයක් ලැබුනහොත් සහ ඔබ හෝ ඔබේ භාරකරු එයට එකඟ නොවන්නේ නම්, ඔබට එම තීරණය අධිකරණයට ගොස් අභියෝග කළ හැකියි. මෙය අභියාචනයක් ලෙස හැඳින්වේ.






# රැකවරණ ක්‍රියාපටිපාටිය පිළිබඳව මම වැඩිදුර තොරතුරු ලබා ගන්නේ කෙසේද?





ඔබේ භාරකරුට අමතරව, රැකවරණ ක්‍රියාපටිපාටිය, ඔබේ අයිතිවාසිකම් සහ වගකීම් ඔබට පැහැදිලි කළ හැකි නීති උපදේශකයින් ද සිටී.

ඔවුන් සම්බන්ධ කර ගන්නේ කෙසේදැයි ඔබේ භාරකරුගෙන් විමසන්න.



ඔබට නීතිඥයෙකුගෙන් උපකාර අවශ්‍ය නම්, ඔබේ භාරකරු හෙ◌ෝ වෙනත් නිලධාරියෙකු සමඟ කතා කරන්න.





## නීතිඥවරයාට, ඔබේ භාරකරු සමඟ එක්ව, ඔබට උපකාර කළ හැකියි:



බලධාරීන් සමඟ සම්මුඛ පරීක්ෂණයකට සූදානම් වීමට



රැකවරණ නිලධාරීන් සමඟ කතා කිරීමට



ඔබේ රැකවරණ අයදුම්පතෙහි තීරණය වටහා ගෙන ඔබ හෙ◌ෝ ඔබේ භාරකරු එම තීරණයට එකඟ වන්නේ නැති නම් අභියාචනයක් ඉදිරිපත් කිරීමට.



ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය අතරතුර ඕනෑම වේලාවක දී ඔබට UNHCR හා සම්බන්ධ විය හැකිය.

UNHCR රැකවරණය සොයන්නන්ට සහ සරණාගතයින්ට සහාය දක්වන අතර ඔවුන් ආරක්ෂා කරයි.

UNHCR හි සේවය කරන පුද්ගලයින් රැකවරණය සොයන්නන් සඳහා තොරතුරු සහ සහාය ලබා දෙයි.

ඔබට https://help.unhcr.org/ වෙබ් අඩවියෙන් වැඩිදුර තොරතුරු සොයා ගත හැකියි.



UNHCR
The UN Refugee Agency

## මම අසනීපෙන් හෝ නිතර කනස්සල්ලෙන් සිටිනවා නම් මට උපකාර ලබාගන්නේ කෙසේද?






ඔබ නැවතී සිටින ස්ථානයේ සේවය කරන ඔබේ භාරකරුට, නිලධාරියෙකුට හෝ කාර්ය මණ්ඩලයට ඒ බව දන්වන්න:






යමෙකු ඔබට රිදවනවා නම්





ඔබට දුකක්, කෝපයක්, බියක් හෝ නිදා ගැනීමට අපහසු බවක් දැනෙනවා නම්






ඔබට ආබාධිතභාවයක් හෝ අසනීපයක් වැනි වෙනත් අපහසුතා තිබේ නම් හෝ ඔබ ගැබ්ගෙන සිටී නම්

එවැනි අවස්ථාවල දී, ඔබට උපකාර ලැබේවි

# මට කිසියම් වගකීමක් තිබෙනවාද?





## ඔව්

**ඔබ මේ රටේ නීති සහ රීති අනුගමනය කළ යුතුයි.**

නීති හෝ රීති පිළිබඳව ඔබට සැකයක් ඇත්නම්, ඔබේ භාරකරුගෙන් විමසන්න.




**ඔබේ භාරකරු ඔබට නැවතී සිටීමට පැවසූ ස්ථානයේ ඔබ නැවතී සිටිය යුතුය.**

බලධාරීන් ඔබට ස්ථානයක් තෝරා දී ඇත. බලධාරීන්ගේ අවසරයකින් තොරව ඉතාලියේ සිට පලා යාම හෝ පිටව යාම සිදු නොකරන්න.



**ඔබ නිලධාරීන් සමඟ එක්ව කටයුතු කළ යුතුය.**

ඉල්ලා සිටින විට, ඔබ ඔවුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය යුතු අතර ඔවුන්ගේ උපදෙස් අනුගමනය කළ යුතුය.



**බලධාරීන් ඔබෙන් ප්‍රශ්න අසන විට අවංක වී ඔබ දන්නා සියල්ල ම ඔවුන්ට පවසන්න.**

ඔබ පවසන දේ ඔබේ අයදුම්පත සඳහා ඉතාමත් වැදගත්.

ඔබට සියල්ල මතක නැති විය හැකි අතර ඔබට සියලුම ප්‍රශ්නවලට පිළිතුරු දීමට නොහැකි විය හැකියි. ඔබට මතක නැති නම්, පිළිතුරක් සෑදීමට නොයන්න, නමුත් ඔබට මතක නැති බව පැහැදිලි කරන්න.

**ඔබ බලධාරීන් සමඟ සියලුම පෙර යොදාගත් හමුවීම්වලට සහභාගී විය යුතුය.**

මෙම පෙර යොදාගත් හමුවීම් ඉතාමත් වැදගත්. ඔබ ලබා දී ඇති දිනයට සහ වේලාවට පෙනී සිටිය යුතුය.







**ඔබ නිවැරදි සම්බන්ධතා තොරතුරු ලබාදිය යුතුය.**

ඔබට සියලුම තොරතුරු සහ පෙර යොදාගත් හමුවීම් ලැබෙන බව සහතික කර ගැනීම සඳහා, ඔබ බලධාරීන්ට ලිපිනයක් හෙ◌ෝ දුරකථන අංකයක් ලබා දිය යුතුය. භාරකරුට ද මෙම තොරතුරු ලැබෙන අතර ඔබේ හමුවීම් පිළිබඳව ඔබට මතක් කළ හැකිය. ඔබේ සම්බන්ධතා තොරතුරු වෙනස් වුවහොත්, ඔබේ භාරකරුට සහ රැකවරණ බලධාරීන්ගේ කාර්ය මණ්ඩලයට දන්වන්න. ඔවුන්ට ඔබ වෙත ළඟා විය හැකි වීම වැදගත් වේ.

**ඔබ සතුව ඇති සියලුම ලියකියවිලි බලධාරීන්ට ලබා දිය යුතුය.**

ඔබට අදාළ ඔබ සතුව ඇති සියලුම ලියකියවිලි සහ ඔබ ඔබේ රට හැර යාමට හේතු ඔවුන්ට ලබා දෙන්න. මෙයට හැඳුනුම්පත් ලේඛන (විදේශ ගමන් බලපත්‍රය), උප්පැන්න හෙ◌ෝ පාසල් සහතිකයක්, වෛද්‍ය ලේඛනයක් හෙ◌ෝ වෙනත් ලියකියවිලි ඇතුළත් වේ.

ඔබ හැකි ඉක්මනින් සියලුම තොරතුරු සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය.

ඔබ සතුව දැනට ලේඛන නොමැති නම්, ඔබට ඒවා පසුව ලබා දිය හැකියි. ඔබේ භාරකරු සමඟ කතා කරන්න. ඔබේ භාරකරුට එම ලේඛන ලබා ගැනීමට ඔබට උපකාර කිරීමට සහ බලධාරීන් සමඟ නියමිත වේලාවට ඒවා බෙදා ගැනීමට හැකි විය හැකියි.

**ඔබට ඔබේ වගකීම් ඉටු කළ නොහැකි නම්, වහාම ඔබේ භාරකරුට සහ රැකවරණ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට දන්වා හේතුව පැහැදිලි කරන්න.**





# මම මගේ වගකීම් ඉටු නොකළහොත් කුමක් සිදුවේද?



ඔබ ඔබේ වගකීම් ඉටු නොකළහොත්, ඔබේ අයදුම්පතට සෘණාත්මක බලපෑමක් ඇති විය හැකියි.


මම පැහැදිලි කළ ඇතැම් අයිතිවාසිකම් සහ සහාය සේවාවන් ඔබට අහිමි විය හැකියි.



**ඔබ ඔබේ වගකීම් ඉටු නොකළහොත්, උදාහරණයක් ලෙස, ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නැවැත්වීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත:**

- ඔබ බලධාරීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු නොදෙන්නේ නම්, හෝ
- ඔබ ඔවුන්ට ඔබේ ඇඟිලි සලකුණු ලබා ගැනීමට ඉඩ නොදෙන්නේ නම්, හෝ
- ඔබ අවසරයකින් තොරව ඔබ නැවතී සිටින ස්ථානයෙන් පිටව යන්නේ නම්.

එවැනි අවස්ථාවල දී, බලධාරීන් සිතන්නේ ඔබ ඔබේ අයදුම්පත පිළිබඳව බරපතළ බවක් නොමැති බවයි. ඔබ අයදුම්කරුවෙකු වීම නැවතෙන අතර සපයනු ලබන සියලු සහාය ඔබට අහිමි වනු ඇත.



ඔබ බලධාරීන්ට ඔබ හෙ◌ෝ ඔබේ කතාව පිළිබඳව සත්‍යය නොකියන්නේ නම් හෙ◌ෝ ඔබ වැදගත් තොරතුරු සඟවන්නේ නම් හෙ◌ෝ ඔබේ ලේඛන හිතාමතාම විනාශ කරන්නේ නම්, ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප කළ හැකි අතර ඔබට රැකවරණය ලබා නොදීමට ඉඩ ඇත.

රැකවරණ ක්‍රියාපටිපාටිය අතරතුර ඔබ සත්‍යය නොකියූ බව බලධාරීන් පසුව දැනගතහොත්, රැකවරණය ඔබෙන් ඉවත් කළ හැකියි.








ඔබ දැනගත යුතු වැදගත්ම දේවල් මම ඔබට පැහැදිලි කළා. රැකවරණ ක්‍රියාපටිපාටිය අතරතුර ඔබේ භාරකරු සහ බලධාරීන් ඔබට වැඩිදුර පැහැදිලි කිරීම් ලබා දේවි.





# මතක තබා ගන්න!

රැකවරණය සඳහා ඉල්ලා සිටීමට ගාස්තු අය නොකරයි






# ප්‍රවේශම් වන්න

අනුග්‍රහයන් හෝ මුදල් වෙනුවට උපකාර කරන පුද්ගලයින්ගෙන් ප්‍රවේශම් වන්න. ඔවුන්ට නරක චේතනාවන් තිබිය හැකියි.



යමෙකු ඔබට පිටව යාමට උත්සාහ කිරීමට දිරිමත් කළ හැකියි. නමුත් ඔබ පිටව නොයා යුතු බව මතක තබා ගන්න, මන්ද මෙය ඔබට අනතුරුදායක විය හැකියි.






ඔබට අවශ්‍ය නැති දෙයක් හෝ වැරදි යැයි පෙනෙන දෙයක් කිරීමට යමෙකු ඔබට ඒත්තු ගැන්වීමට උත්සාහ කරනවා නම්, වහාම ඔබේ භාරකරුට හෝ ඔබ නැවතී සිටින ස්ථානයේ සේවය කරන වැඩිහිටියන්ට දන්වන්න.



# මට මගේ මව් රටට ආපසු යාමට සහ මගේ අයදුම්පත නැවැත්වීමට අවශ්‍ය නම්, මම කළ යුත්තේ කුමක්ද?





ඔබට ඔබේ මව් රටට ආපසු යාමට සහ ඔබේ අයදුම්පත නැවැත්වීමට අවශ්‍ය නම්, ඔබේ භාරකරුට සහ බලධාරීන්ට දන්වන්න. ඔවුන්ට ඔබට ආරක්ෂිතව ආපසු යාමට උපකාර කළ හැකියි.



**මම දැන් පැහැදිලි කළ දේ පිළිබඳව ඔබට වැඩිදුර ප්‍රශ්න තිබේ නම්, ඔබේ භාරකරුගෙන්, බලධාරීන්ගෙන් හෝ ඔබ නැවතී සිටින ස්ථානයේ සේවය කරන කාර්ය මණ්ඩලයෙන් විමසන්න.**



මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025